(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **12.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

---

**2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා අ.භා. 1.00 ට**

---

# පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ සබඳතා අමාත්‍යතුමා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ආරුමුගන් තොණ්ඩමන් මහතා,** ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** පුනර්ජනනීය බලශක්ති හා විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** ඉඩම් හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** ජාත්‍යන්තර සහයෝගීතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **ජෝන් අමරතුංග මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **වසන්ත අලුවිහාරේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු මලිත් ජයතිලක මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු ලකී ජයවර්ධන මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු නවීන් දිසානායක මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා
ගරු මුහම්මදු නසීර් මහතා
ගරු එස්. බී. නාවින්න මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු තිලක් මාරපන මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු ෆයිසර් මුස්තාපා මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු සමන් රත්නප්‍රිය මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු සාගල රත්නායක මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු ඒ. ඒ. විජේතුංග මහතා
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු ධුලිප් විජේසේකර මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු මලික් සමරවික්‍රම මහතා
ගරු මංගල සමරවීර මහතා
ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
ගරු සන්දිත් සමරසිංහ මහතා
ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
ගරු මුත්තු සිවලිංගම් මහතා
ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු චතුර සංදීප සේනාරත්න මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු ඩී. බී. හේරත් මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා
ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා
ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්
නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්
කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්
ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයාගේ නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"2020 ජනවාරි 21 වැනි දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රන්ජන් රාමනායක මහතා විසින් පාර්ලිමේන්තු සභාගර්භයේ දී කතාවක් පවත්වන ලදී. එම කතාව අතරතුර හඬපට කිහිපයක් සභාගත කරන බව එතුමා විසින් ප්‍රකාශ කළ නමුත්, එදින හඬපට සභාගත කිරීමක් සිදුකර නොතිබිණි. එකී හඬපට සභාගත නොකරන ලද බව එදින හැන්සාඩ් වාර්තාවේ 430 හා 437 තීරුව යටතේ ඉතා පැහැදිලිව දක්වා ඇත.

කෙසේ වෙතත් ඉන් දින කිහිපයකට පසුව, එනම් 2020 ජනවාරි 24 වැනි දින සවස පාර්ලිමේන්තුවේ රැස්වීම ද අවසන් වූ පසුව ගරු මන්ත්‍රීතුමා විසින් දුරකථන සංවාද 19ක් අඩංගු හඬපටයක් හැන්සාඩ් දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී. ඒ වනවිට 21 වැනි දිනට අදාළ හැන්සාඩ් වාර්තාව මුද්‍රණය කර තිබුණි. මෙම සභාගත කරන ලද හඬපටය මන්ත්‍රීවරුන්ට ඇසීමට නිකුත් කරන මෙන් මන්ත්‍රීවරුන් විසින් බලවත් ඉල්ලීම් කිහිපයක් කරන ලදී. 2020.02.07 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් මා විසින් පක්ෂ නායකයන් දැනුවත් කරන ලද අතර, එහිදී එළැඹි එකඟතාව මත අදාළ හඬපටයේ අඩංගු ඇතැම් කරුණු සංස්කරණය කිරීමෙන් පසුව මන්ත්‍රීවරුන්ට මුදා හැරීම සුදුසු යැයි අදහස් කරන ලදී. ඒ අනුව මෙම හඬපටයේ අඩංගු පටිගත කිරීම් පිළිබඳ වාර්තා කිරීම සඳහා මා විසින් මන්ත්‍රීවරුන් සිව්දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී.

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද ලේඛන සම්බන්ධයෙන් මෙම ගරු සභාව විසින් පවත්වාගෙන යනු ලබන පිළිගත් සම්ප්‍රදායන් හා කාර්ය පටිපාටියක් ඇත. කිසියම් ලේඛනයක් එලෙස සභාගත කරනු ලබන්නේ මූලාසනයේ අවසරය හා අනුමතිය ලබා දෙන්නේ නම් පමණි. එසේම එම සභාගත කරනු ලබන ලේඛනය මන්ත්‍රීවරයෙකු විසින් කරනු ලබන කථාවට අදාළත්වයක් තිබිය යුතුය. එම සභාගත කරන ලේඛන, කථාව අවසන් වූ වහාම සභා මේසය මත තැබිය යුතුය. එසේ සභාගත කරනු ලැබූ ලේඛනයක් නැවත සංස්කරණය කිරීමක් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියා පටිපාටිය නොවන බව දන්වනු කැමැත්තෙමි.

කෙසේ වෙතත්, ගරු මන්ත්‍රීවරුන්ගෙන් නැගුණු බලවත් ඉල්ලීම නිසා සහ පක්ෂ නායක රැස්වීමේ දී එකඟ වූ පරිදි සංවාද 19ක් අඩංගු මෙම හඬපටය සංස්කරණය කිරීමෙන් අනතුරුව මුදා හැරීමට සුදුසු බව මා තීරණය කරන ලද අතර, මෙම තීරණය මතු දිනක සභාගත කරනු ලබන ලේඛන පිළිබඳව පූර්වාදර්ශයක් නොවිය යුතු බවටත් තරයේ අවධාරණය කරනු කැමැත්තෙමි.

පාර්ලිමේන්තුව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත මඟින් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති භාෂණයේ නිදහස ඔවුන් විසින් වගකීමකින් යුතුව මෙම ගරු සභාවේ කීර්තිය හා ගෞරවය සුරක්ෂිත වන ආකාරයෙන් භාවිතා කරනු ඇතැයි මා විශ්වාස කරමි.

අනාගතයේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලේඛන සභාගත කිරීමේ දී මවිසින් ඉහත සඳහන් කර ඇති පරිදි තම වගකීම නිසි පරිදි ඉටු නොකරන්නේ නම් එබඳු අවස්ථාවක දී එසේ සභාගත කරනු ලබන ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබීමට සිදු වනු ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින්—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව සහ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 30 වගන්තිය ප්‍රකාරව, 2019 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2019.01.01 - 2019.03.31) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 153ඌ ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ තෙවැනි කාර්තුව සඳහා

(2019.07.01 - 2019.09.30) විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2018 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2018.01.01 - 2018.03.31) සහ දෙවැනි කාර්තුව සඳහා (2018.04.01 - 2018.06.30) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තා; සහ

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) සහ 55(5) ව්‍යවස්ථා ප්‍රකාරව 2019 වර්ෂයේ තෙවැනි කාර්තුව සඳහා (2019.07.01 - 2019.09.30) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව

පිළිගන්වන ලදී.

එකී යන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 ඔක්තෝබර් 31 දිනැති අංක 2147/72 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 දෙසැම්බර් 14 දිනැති අංක 2153/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 4, 13 සහ 17 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 05/2019 දරන සුරාබදු නිවේදනය);

(iv) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 07/2019 දරන සුරාබදු නිවේදනය);

(v) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 08/2019 දරන සුරාබදු නිවේදනය); සහ

(vi) සුරාබදු ආඥා පනතේ (52 අධිකාරය) 22 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 2152/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 09/2019 දරන සුරාබදු නිවේදනය)

පිළිගන්වා, එම නියෝග සහ නිවේදන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.06.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අටවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ තෙවැනි වාර්තාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ 2017 වර්ෂයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ලිමිටඩ්) ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 දෙසැම්බර් 30 දිනැති අංක 2156/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන්; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, නාගානන්ද ඉන්ටනැෂනල් ඉන්ස්ටිටියුට් ෆො බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 06 දිනැති අංක 2157/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන්

පිළිගන්වා, එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** (1) ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපති ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා විසින්, ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2020 පෙබරවාරි 19 වැනි බදාදා සලකා බලනු ලැබේ.

(2) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මහතා විසින්, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2018 මුදල් වර්ෂය සම්බන්ධයෙන් අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව සහ අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව (2019.02.20 සිට 2019.11.07 දක්වා) පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයිද, මුද්‍රණය කළ යුතුයැයි ද, නියෝග කරන ලදී.

(3) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්, අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයිද, මුද්‍රණය කළ යුතුයැයි ද, නියෝග කරන ලදී.

(4) බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු චන්දිම ගමගේ මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2015 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(v) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(5) සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු ඩුලිප් විජේසේකර මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, "2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(6) ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මයන්ත දිසානායක මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2013 - 2017 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වාර්ෂික වාර්තා;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා සහ ගිණුම්;

(v) 2016 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(vi) 2017 වර්ෂය සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(7) ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය;

(ii) 2013 සහ 2018 වර්ෂ සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(iii) 2018 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2018 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2016 සහ 2017 වර්ෂ සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(vi) 2018 වර්ෂය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vii) 2018 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2018 වර්ෂය සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ix) 2018 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(x) 2016 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව;

(xi) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(xii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(xiii) 2017 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(xiv) 2017/18 වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(8) කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2015 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(9) කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු වෛද්‍ය තුසිතා විජේමාන්න මහත්මිය විසින් එම කාරක සභාව විසින් සකස් කරන ලද ''පවුල් නීති ප්‍රතිසංස්කරණය'' සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු අශෝක ප්‍රියන්ත මහතා, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

''දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.''

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**6. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1) :** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යවරිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරිය ඉදිරිපත් කළ යෝජනාව,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3(ඹ) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සායනික පරීක්ෂණ සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2) :** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යවරිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරිය ඉදිරිපත් කළ යෝජනාව,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 21 දිනැති අංක 2146/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය :** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015/2016) :** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2018.08.08 දින ඉදිරිපත් කරන ලද, 2016.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ පනතේ 23 වැනි වගන්තිය යටතේ 2018.08.08 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 - 1A වගන්තිය යටතේ 2018.05.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ 14 - 1A වගන්තිය යටතේ 2018.09.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසට අනුව 2019.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.01.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යවරයා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.07.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය යටතේ 2018.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016/2017) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 12, පරිච්ඡේද අංක 6.5.3 යටතේ 2018.06.21 දින ඉදිරිපත් කරන ලද, 2017.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**18. පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2018.08.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**19. වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය යටතේ 2018.09.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**20. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 27 වැනි වගන්තිය යටතේ 2018.09.18 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**21. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**22. වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014) :** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යවරයා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යවරයා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වැනි වගන්තිය යටතේ 2019.05.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**23. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.07.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**24. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015) :** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2017.11.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**25. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016) :** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2018.10.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**26. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014) :** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ සබඳතා අමාත්‍යවරයා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වැනි වගන්තිය යටතේ 2019.01.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.03 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

**27. කල් තැබීම (භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ චෝහාරික විගණන වාර්තා) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු තේනුක විදානගමගේ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.00 ට ගරු තේනුක විදානගමගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.00 ට ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2020 පෙබරවාරි 19 වැනි බදාදා අ.භා. 1.00 වනතෙක් කල් ගියේය.